www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රයිස්ගේ මැද පෙරදිග සංචාරය: යුද්ධය අවුලුවා ලීමේ ‘රාජ්‍යතාන්ත්‍රිකය’

## Rice’s Middle East tour: “Diplomacy” in furtherance of war

**ක්‍රිස් මාස්ඩන් විසිනි**
**2006 ජුලි 24**

එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ගාසා හි හා ලෙබනනයේ ගැටුම පිලිබඳව සාකච්ඡා කිරීමට ටෙල් අවිව් කරා ලඟා වීමට නියමිත දිනට පෙර දිනයේ, *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත වාර්තා කලේ බුෂ් පරිපාලනය, ඊස්රායලය විසින් ඉල්ලා ඇති චන්ද්‍රිකා හා ලේසර්-මඟ පෙන්වන බෝම්බ පිටත්කර හැරීමට යුහුසුලුව සිටින බවයි. මෙම පියවර, ආයුධ හා බලය මගින් මැද පෙරදිග තුල තමාගේ ම ආධිපත්‍ය පිහිටුවා ගැනීමේ සැලසුම් තව දුරටත් ගෙන යාම සඳහා ඊස්රායලය නමැති සිය තැරැව්කරුවාට, ඇමරිකානු බලය ලබා දීමේ, වොෂින්ටන්හි “රාජ්‍යතාන්ත්‍රිකයේ” සැබෑ ස්වරූපයෙහි මූර්තියක් වෙයි.

*ටයිම්ස්* පත්‍රයට අනුව ඊස්රායලය ඉල්ලීම කර ඇත්තේ “වෙලාවට අනුකූලව” ය. ඊස්රායලය ගුවනින් හා මුහුදින් ලෙබනනයට පහර දීමට පටන් ගත්තේ ජුලි 12 දින ය. ඊස්රායලයට හිතවත් පුවත්පත, මෙය සිදු වූයේ නිල වසයෙන් සතුරුකම් ආරම්භවීමට පෙර ද පසුව ද යන්න සඳහන් නොකරන්නේ, හෙස්බුල්ලාවරුන් විසින් ඊස්රායල් සොල්දාදුවන් දෙදෙනා අල්ලා ගැනීමට ප්‍රතිචාර දක්වන ආරක්ෂක මෙහෙයුමක් ලෙස, යුද්ධය දියත් කලේ ය යන ඇඟවීමෙහි එල්බ සිටීම සඳහා ය.

ඊස්රායලයට, එක්සත් ජනපද යුද ආම්පන්න නැව් ගත කිරීම කඩිනම් කිරීම පිලිබඳ *ටයිම්ස්* වාර්තාව ගැන සඳහන් කල එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරියෙක් කියා සිටියේ “මේ පිලිබඳව කිසිවක් ප්‍රකාශ නොකරන්නෙමු” යනුවෙනි.

කුමන ප්‍රකාශනයක් හෝ අවශ්‍ය ද නැත. ආයුධ නැව් ගත කිරීම, වොෂින්ටනය සමග සෘජු ලෙස සම්බන්ධ වෙමින් හා එය වෙනුවෙන් පලස්තීන අධිකාරයට හා ලෙබනනයට ඊස්රායලය විසින් පහර දෙන බවට තවත් සාක්ෂියක් පමනි.

ටෙල් අවිව්වලින් ආයුධ සඳහා ඉල්ලීම ඉදිරිපත් වූයේ, ජීබීයූ 28 නමින් හඳුන්වන, ලේසර්-මඟ පෙන්වන “බිංගෙවල් බිඳින්නා” යන බෝම්බ 100ක් තරම් සංඛ්‍යාවක් මිලට ගැනීමට ඊස්රායලයට අවසර ලැබුනු, 2005 වසරේ අනුමත කෙරුනු ඩොලර් බිලියනයක ආයුධ පැකේජය යටතේ ය. කොපමන සංඛ්‍යාවක් නැව් ගත කර ඇත්දැයි කිසිවෙකු නො දනී. එහෙත් සමහර විශ්ලේෂකයන් පෙන්වා දී ඇත්තේ ලෙබනනයට බෝම්බ දැමීම තව කාලයක් කරගෙන යනු ඇති බවට මෙය ඇඟවීමක් බවයි. තවද, ලෙබනනය එකම ඉලක්කය වනු ඇති බවට ද කිසිදු නිශ්චිත බවක් නැත.

පසු ගිය වසරේ ආයුධ ගිවිසුම ඇති කර ගන්නා විට, බිංගෙවල් බිඳින්නා ඊස්රායලයට ලැබෙන්නේ ඉරාන න්‍යෂ්ටික ප්‍රතිකාරකයන් වෙත පහර දීමට ය යන අදහස බැහැර කරන ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීමට අගමැති ඒරියල් ෂැරොන්ට බල කෙරුනි. බොම්බ සවි කරනු ලබන්නේ ඉරානය සිය ප්‍රහාරක සීමාවට ඇතුලත් කර ගත හැකි, එක්සත් ජනපදය විසින් සපයනු ලබන එෆ් 15 ප්‍රහාරක ජෙට්යානාවල ය. මූලධර්මයක් ලෙස එවන් ක්‍රියාවකට සහාය දීමට තමන් සූදානම් බව වොෂින්ටනය දැනට මත් අඟවා ඇත. එහෙත් පටන් ගැනීමට අවසර දීමෙන් වැලකී සිටින්නේ, ටෙහෙරානයට එරෙහි එවන් ක්‍රියාවකට යුරෝපීය බලවතුන්ගේ එකඟතාවය දිනා ගැනීමට ඔවුන් අපේක්ෂා කරන බැවිනි.

ජනාධිපති බුෂ් සමග ඉරානය පිලිබඳව සාකච්ඡා කිරීමෙන් පසුව, ෂැරොන් සීඑන්එන් නාලිකාවට කියා ඇත්තේ ඉරානය න්‍යෂ්ටික ආයුධ ගොඩ නැගීමේ “ තාක්ෂනික ගැටලු” විසඳා ගෙන ඇත් නම් එය “ආපසු නොපැමිනිය හැකි ලක්ෂයක්” වනු ඇති බවයි.

බිංගෙවල් බිඳින්නා බෝම්බ ඊස්රායලය මගින් යොදවා ඇති, එක්සත් ජනපදයේ නිෂ්පාදිත දැවැන්ත ආයුධ ගබඩාවේ එක් කොටසක් පමනි. ඊස්රායලයට වසරකට ඩොලර් බිලියන 3ක් ආධාර වසයෙන් ඇමරිකාවෙන් ලැබෙයි. ඉන් තුනෙන් දෙකක්ම මිලිටරි ආධාර ය. එරට ගුවන් හමුදාව ඇමරිකාවේ නිෂ්පාදිත එෆ් 16 ෆැල්කන් ප්‍රහාරක යානා, එෆ් 15 ඊගල් ප්‍රහාරක යානා හා ඒඑච් 64 ඇපාඩි ප්‍රහාරක හෙලිකොප්ටර්වලින් සන්නද්ධ ය.

“කලාපයේ සාමය හා ආරක්ෂාව” පවත්වා ගැනීම සඳහා ඊස්රායල ගුවන්යානාවලට උපකාර පිනිස තමන් මිලියන 210 දක්වා වටිනාකමකින් යුත් ජේවී 8 නම්

ගුවන් යානා ඉන්ධන එරටට විකිනීමට සැලසුම් කර ඇති බව සිකුරාදා පෙන්ටගනය කොන්ග්‍රසය වෙත දන්වා සිටියේ ය.

ඉරානයට හා සිරියාවට එරෙහිව යලියලිත් තර්ජන කරන අතර ලෙබනනයට පහර දීම සඳහා නිදහස් වර පත්‍රයක් ඊස්රායලය වෙත දිගටම ලබාදෙනු ඇති බව, රයිස්ගේ පැමිනීමට පෙරාතුව බුෂ් පරිපාලනය විසින් පැහැදිලිව ප්‍රකාශයට පත් කර තිබේ. රයිස්ගේ සංචාරයට පෙර දසුනක් ලෙස සෙනසුරාදා පැවැති සිය ගුවන්විදුලි කතාවේ දී, ජෝර්ජ් බුෂ් කියා සිටියේ, "අර්බුදයට විසඳුම, ඉල්ලා සිටින්නේ ප්‍රහාර එල්ල කරන ත්‍රස්තවාදී කන්ඩායම හා ඊට සහයෝගය දෙන ජාතීන් සමග පොර බැදීමක් බව ඇය පැහැදිලි කරනු ඇති" බවයි.

ඊට පෙර දින, සටන් විරාමයක් සඳහා ඉල්ලීම යලි වතාවක් ප්‍රතික්ෂේප කල රයිස්, කියා සිටියේ ලෙබනන්හි සිවිල් ඉලක්ක හා යටිතල ව්‍යුහය වෙත එල්ල කෙරෙන ඊස්රායල් ප්‍රහාර අවසන් කිරීමක් "අප හුදෙක් පැවති තත්වය කරා යලි ලඟා වීමක් නම් එය බොරු පොරොන්දුවක්" වනු ඇති බවයි. ඇය තවදුරටත් කියා සිටියේ "කල යුත්තේ කුමක් දැයි සිරියාව දන්නා අතර හෙස්බුල්ලාවරු ගැටලුවේ මූලාශ්‍රය" බවයි. ගැටලුව පිලිබඳ තවත් එක් කුපාඩි ප්‍රකාශනයක් තුල ඇය ලේබනයේ තත්වය විස්තර කලේ "නව මැද පෙරදිගක විලිරුදාව" ලෙස ය.

මෙම ප්‍රකාශය උපදේශාත්මක ය. එය පැහැදිලි කර ඇත්තේ ලෙබනනයට එල්ල කෙරෙන ප්‍රහාරය පිටුපස සිටින ගාමක බලවේගය බුෂ් පරිපාලනය බවත් මෙය, මුලුමහත් කලාපයේ ම සැකැස්ම යලි පිහිටුවීමේ ආරම්භය පමනක් බවත් ය.

ගාසාවට හා ලෙබනනයට පහරදීමේ තමන්ගේ ම හේතු, ඊස්රායල් කඩිමා-ලේබර් සභාග ආන්ඩුවට ඇත. බටහිර ඉවුරේ වැඩි කොටසක් ද සමස්ත යෙරුසලම ද එක් කර ගන්නා මහා ඊස්රායලයක සැලැස්ම සඳහා, අරාබි මහජනතාව අතර ඇති සියලු විරෝධතාවන් තලා දැමීමේ අවශ්‍යතාව එයට ඇත. එහෙත් එරට, ස්වාධීන ක්‍රියාකාරිකයෙක් නොවන අතර, එක්සත් ජනපදයේ ඍජු මිලිටරි මැදිහත් වීම ද ඇතුලත් වොෂින්ටනයේ සම්පූර්න දේශපාලන, මිලිටරි හා මූල්‍යාධාර නොමැතිව එහි අරමුනු සාක්ෂාත් කර ගත නොහැකි ය.

ලෙබනනයේ වඩාත් බල සම්පන්න අසල්වැසියා වන සිරියාවට අත නොතබා ලෙබනනයට දිගටම පහර දීම ඊස්රායලයට කල නොහැකි ය. වඩාත් වැදගත් වන්නේ අවසන් වසයෙන් ඉරානයේ මිලිටරිමය පරාජය කැඳවුම් කර සිටින වොෂින්ටනය වෙනුවෙන් කලාපීය පොලිස්කාරයාගේ ක්‍රියාකලාපය බාරගෙන සිටින ඊස්රායලයේ අගමැති එහුඩ් ඕල්මට් මැයි මාසයේ දී විස්තර කලේ මෙය "පවත්නා තර්ජනය" ලෙස ය.

ඊස්රායලය තම සොල්දාදුවන් අල්ලා ගැනීමේ සිද්ධිය, ඇමරිකාව සමග එක්ව කල් තියා සැලසුම් කල මිලිටරි ප්‍රහාරය ක්‍රියාත්මක කිරීම සඳහා, නරුම ලෙස යොදා ගත් බව සනාථ කරන වාර්තා පලවෙමින් තිබේ.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* මීට පෙර, *සෙන්ට් ෆ්‍රැන්සිස්කෝ ක්‍රොනිකල්* පත්‍රයේ ජුලි 21 දින පල වූ වාර්තාවකට, අවධානය යොමු කරවී ය. පසුගිය සතියේ හෙස්බුල්ලා සටන්කරුවන්ගේ ක්‍රියාව ප්‍රකෝපකරනයක් ලෙස සලකා ඊස්රායලය, සිය මිලිටරිය ඊට ගුවනින් ගොඩබිමින් හා මුහුදින් ප්‍රතිචාර දැක්වී ය. යන ප්‍රකාශයේ "ව්‍යාජත්වය මීට වසරකටත් පෙර සකස්කල සැලසුමකින් එලිදරව් වේ." ක්‍රොනිකල් හි එය මෙසේ පලවිය. "වසරකටත් පෙර ජ්‍යෂ්ඨ ඊස්රායල් හමුදා නිලධාරියෙක්, නිලවාර්තාවෙන් පරිබාහිර පදනමක සිට එක්සත් ජනපදයේ හා අනෙකුත් රාජ්‍යතාන්ත්‍රිකයන්, මාධ්‍යවේදීන් හා බුද්ධිමන්ඩල සාමාජිකයන් හමුවේ, වර්තමාන ක්‍රියාන්විතය සඳහා සකස්කල විස්තරාත්මක සැලැස්මක් ගෙන හැර දැක්වී ය."

*ජෙරුසලම් පෝස්ට්* පත්‍රයේ පලවූ ඩේවිඩ් හොරොවිට්ස්ගේ ලිපියකින්, ලෙබනන් ප්‍රහාරය කලින් සැලසුම් කල එකක් බවට අතිරේක සාක්ෂ්‍ය සපයා දෙයි. "පසු ගිය දින නමය තුල අයිඩීඑෆ් (ඊස්රායල ආරක්ෂක හමුදාව) විසින් ක්‍රියාවට නගන සටන් සැලැස්ම අවසාන වසයෙන් සකස්කලේ නව ආන්ඩුව (කඩිමාහි නායකත්වයෙන් යුත්) ගොඩ නැගෙමින් තිබූ කාල යේ එනම් මාස හතරකට හෝ පහකට පෙර ය."

ජුලි 23 දින *හාරෙට්ස්* පත්‍රය අලුෆ් බෙන් විසින් සකස් කල "මාරුවෙන ප්‍රතිපත්ති / නව න්‍යායපත්‍රයක්, නව පර්යායක්" යන හිසින් වූ වාර්තාවක් පල කල අතර, එහි මෙසේ සඳහන් විය. "පසු ගිය සති අන්තයේ ඕල්මට් (අගමැති එහුඩ්) මොසාඩ් හි ප්‍රධානියා වන මෙයර් ඩ්‍රගාන්, එක්සත් ජනපද නිලධාරීන් සමග ඉරාන න්‍යෂ්ටික තර්ජනය නතර කිරීම සම්බන්ධ සාකච්ඡාවක් සඳහා පිටත් කලේ ය. ලෙබනනයේ සටන් අවසන් වී උතුරේ යම් ආකාරයක පිලිවෙලක් ඇති කිරීමෙන් පසුව, අගමැතිවරයා නව න්‍යායපත්‍රය ගැන සාකච්ඡා කිරීම සඳහා යලිත් ධවල මන්දිරය වෙත යනු ඇත."

සියොන්වාදී රාජ්‍යයේ නග්න ආක්‍රමනකාරීත්වය හා සිවිල් වැසියන් ඉලක්ක කිරීමත්, එසේ කරගෙන යාමට ඉඩ හැරීම වෙනුවෙන් දේශපාලන සුජාතභාවයක් හා රාජ්‍යතාන්ත්‍රික ආවරනයක් සැපයීම්වස්, රාජ්‍ය ලේකම් රයිස්ගේ මැද පෙරදිග සංචාරය, ඊස්රායලය සමග සම්බන්ධීකරනය කෙරේ. අගමැති ඕල්මට් හා පලස්තීන අධිකාරියේ ජනාධිපති මහමුඩ් අබ්බාස් සමග සාකච්ඡා කිරීමට ජෙරුසලමට ගොඩබැසීමෙන් පසුව රයිස්, රෝමය හා මැලේසියාවට ගමන් ගනියි. යලිත් ඊස්රායලයට පැමිනෙන්නේ ජුලි 30 දින ය. අඩුම තරමින් ඒ වන තෙක් මිලිටරි ක්‍රියාන්විතය ඉදිරියට ගෙන යාමට, එක්සත් ජනපදයේ අනුමැතිය ලැබී ඇති බවට,

ඊස්රායලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හාරෙට්ස් පත්‍රයට ප්‍රකාශ කලහ.

සිරියාව හා ඉරානය හුදෙකලා කර, ලෙබනනය ඊස්රායලයේ නියම වැයික්කියක් බවට පිරිහෙළීමේ එක්සත් ජනපද ඊස්රායල් සැලසුම් සඳහා, අනෙකුත් මහා බලවතුන්ගේ හා අරාබි ධනපති තන්ත්‍රයන්ගේ එකඟතාවය ලබා ගැනීම, රයිස්ගේ අරමුනයි.

රයිස් පිටත්ව යාමට පෙර, ඇය හා බුෂ්, උප ජනාධිපති චේනි ද ඇතුලත් පරිපාලනයේ ඉහල නිලධාරීන් සමග වොෂින්ටනයේ දී ද, සව්දි අරාබියේ විදේශ ඇමති සාවුඩ් අල් ෆයිසාල් සවුදි ජාතික ආරක්ෂක මන්ඩලයේ ප්‍රධානී බන්ඩාර් ඉබන් සුල්තාන් හා වොෂින්ටනයේ සව්දි තානාපති ටර්කි ඉබන් ෆයිසාල් සමග ද, සාකච්ඡා පැවැත්වූවා ය. වත්මන් ගැටුම අරභයා හෙස්බුල්ලාවරුන්ට චෝදනා කිරීමේ දී, වොෂින්ටනය සමග පෙල ගැසුනු මෙම රාජධානිය, අනාගතයේ දී සිරියාව හා ඉරානයට පහර දීමට ද පෙල ගැසී සිටියි.

රෝමයේ දී රයිස්, බ්‍රිතාන්‍ය, ප්‍රන්සය, ඉතාලිය, යුරෝපා සංගමය, රුසියාව, ඊජිප්තුව, සවුදි අරාබියාව, ජෝර්දානය, එක්සත් ජාතීන් හා ලෝක බැංකුව ද අගමැති ෆාද්ඩ් සිනිබ්රා මෙහෙයවන ලෙබනන් ආන්ඩුව ද ඇතුලත් ලෙබනන් කන්ඩායමේ සාමාජිකයන් හමුවීමට නියමිත ය. සව්දි අරාබිය මෙන් ම ඊජිප්තුව හා ජෝර්දානය ද වොෂින්ටනයේ මැද පෙරදිග ප්‍රතිපත්තිය පිලිගැනීමට සූදානම් බව පැහැදිලි කර තිබේ.

සැම දිනකම සිරියාවට එරෙහි මිලිටරි ක්‍රියාමාර්ග ගන්නා බවට තර්ජනය කලත් සිරියාව සමග කතා කිරීමට වත් රයිස්ගේ අදහසක් නැත. එක්සත් ජාතීන්ගේ ඇමරිකානු තානාපති ජෝන් බෝල්ටන් ෆොක්ස් නිව්ස් චැනලයේ සාකච්ඡාවකට ඊයේ එක් විය. එදින උදේ සිරියානු නියෝජ්‍ය විදේශ ඇමති ෆයිසාල් මෙක්ඩාඩ් කල ප්‍රකාශය පිලිබඳව එහිදී ඔහුගෙන් අදහස් විමසුවේ ය. මෙක්ඩාඩ් ප්‍රකාශ කලේ "අන්‍යොන්‍ය අවශ්‍යතාවන් හා ගරුත්වය මත පදනම්ව එක්සත් ජනපදය සමග සංවාදයකට සිරියාව සූදානම් ය" යනුවෙනි.

"සිරියාව විසින් කලයුතුව ඇත්තේ කුමක්ද යන්න අවබෝධ කර ගැනීමට සංවාදයක් අවශ්‍ය නැත. ඉරානය ද සමග සිරියාව ම, ගැටලුවේ සැබෑ පාර්ශ්වයකි" යි ප්‍රකාශ කරමින් බෝල්ටන් සිරියානු ආරාධනය ඉවත දැමී ය.

වොෂින්ටනය විසින් තමන් වෙත පිරිනමා ඇති අවස්ථාව යොදා ගනිමින් ඊස්රායලය, ලෙබනනයෙහි උපරිම විනාශය ඇති කරමින් සිටියි. ලෙබනනයෙහි යටිතල ව්‍යුහය විනාශකිරීමේ ගුවන් වාර 3000කට වැඩි සංඛ්‍යාවක් ඊස්රායල ප්‍රහාරක යානා මගින් සිදු කර ඇත. දකුනු ලෙබනනය තුල ගොඩබිම් ප්‍රහාරයක් සඳහා සූදානම් වෙමින්, ලෙබනන් දේශ සීමාව අසල සන්නද්ධ රථ හා හමුදා භට පිරිස් රැස්කර ඇති අතර ජුලි 21 වැනි දින 3000ක සංචිත හමුදා  භටයන් සේවයට කැඳවී ය.

පසු ගිය පැය 24 තුල, ඊස්රායල ගුවන් හමුදාව ව්‍යසනය ආවරනය කිරීම වැලැක්වීමේ පියවර ලෙස බේරූට්හි අල් මනාර් රූපවාහිනී මධ්‍යස්ථානය ද ඇතුලු ඉලක්ක 120කට වැඩි ප්‍රමානයකට පහර දුන්නේ ය. ඊස්රායල් ලෙබනන් දේශසීමාව දිගේ පිහිටි ගම්මානවල දහස් ගනන් පලා යන සරනාගතයන් පැමිනෙමින් සිටි වරාය නගරයක් වන සිඩොන් වෙත මිසයිල් ප්‍රහාර එල්ල විය. ඉන් එක් අයෙක් මරුමුවට පත් විය. වරාය බඳ නගරයක් වූ ටයිරේ අසල ගම්මානයකට පහරදීමෙන් ලමයෙක් ද, ටයිරේ කරා මගීන් ගෙන යමින් තිබූ කුඩා බසයකට එල්ල කල ප්‍රහාරයෙන් තිදෙනෙක් ද මිය ගියහ.

ඛේදජනක මට්ටමේ විනාශයක් දූනට මත් ලෙබනනයට අත් කර දී තිබේ. එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාවන්ට අනුව ජනගහනයෙන් සියයට 15ක් පමන වූ 800,000ක් ලෙබනන් වාසීන්ට නිවාස අතහැර පලායාමට බලකෙරී ඇත. එක්සත් ජාතීන්ගේ හදිසි ආධාර සම්බන්ධීකාරක ජෑන් ඊගලන්ඩ්ට අනුව අඩුම තරමින් 365ක් මරා දමා ඇති අතර ඉන් තුනෙන් එකක් ම ලමයින් ය.

බේරූට්හි සංචාරය කරන අතරතුර, ලෙබනන් ජනතාවට හදිසියෙන් ම අවශ්‍ය ආධාර සැපයීමේ ආරක්ෂිත මාවත් අවහිර කිරීම පිලිබඳව ඊගලන්ඩ් ඊස්රායලයට චෝදනා කරමින් මානුෂික ව්‍යසනයක් වලක්වා ලීම සඳහා මිලියන 100ක මුදලක් වහාම ලබා දෙන ලෙස ලෝකයෙන් ඉල්ලා සිටියේ ය. "අප විශේෂයෙන්ම කනස්සල්ලට පත්ව සිටින්නේ බේරූට් හා රටේ දකුනු ප්‍රදේශ ගැන ය. තුවාලකරුවන්ට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලැබී නොමැත. සනීපාරක්ෂක පහසුකම් හා පානීය ජල ප්‍රශ්නය උග්‍ර ය. ප්‍රථමයෙන් ම හා ප්‍රධාන කොට ම ලක්ෂ ගනන් ජනතාව කොටුකිරීමට ලක්ව සිටිති."

කඳු ගැසී ඇති සුන්බුන් නිරීක්ෂනය කල ඔහු ජාත්‍යන්තර මානුෂික නීති උල්ලංඝනය කර ඇති බවට ඊස්රායලයට චෝදනා කලේ ය.

"ඒ නිවාස පේලි දුයි මට සිතාගැනීමට පවා නොහැකි පරිදි එය විශාල ය. පුලුල්  හා බිහිසුනු ය."

© www.wsws.org